# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2013 සැප්තැම්බර් මස 06 වන දින

## II වන කොටස

## අතිරේකය

(2013.09.09 දින නිකුත් කරන ලදී)

# ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති

**ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක කිරීම පිණිස ද: උත්තේජක ද්‍රව්‍ය මර්දන නියෝජ්‍යායතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම මගින් එකී සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඉහත කී සම්මුති රාමුව තුළ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිවීම සඳහා අදාළ දේශීය නීතිමය යන්ත්‍රනයක් නිශ්චිතවම සඳහන් කිරීම පිණිස ද: ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

ක්‍රීඩා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 21.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 15.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳුන්වනු ලබන 431 වන අධිකාරය වන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ 13 වන වගන්තිය සංශෝධනය කරන අතර සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතියේ බලපෑම වන්නේ, නියමිත දින හෝ ඊට පසු රාජ්‍ය සේවයට ඇතුළත් වූ සහ (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම යාමකට හෝ ඉවත් කිරීමකට පෙරාතුව වසර දහයක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති රජයේ නිලධරයකු ඉහතකී වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රතිලාභවලට සුදුසුකම් ලැබීමට සැලැස්වීම වන්නේ ය.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිවම 27අ සහ 27ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධන කරන අතර එකී වගන්තිවල නීතියේ බලපෑම පහත දැක්වෙන පරිදිවේ එනම්—

(අ) 27අ වගන්තිය මගින්—

(අ) හදිසි නීති නියෝග යටතේ වරදක් සංයුක්ත කරනු ලබන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් විශ්‍රාම යාමේ වයසට පෙර මිය යන රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට එකී නිලධරයා මිය ගිය දින සිට, ඔහුගේ විශ්‍රාමයාමේ දින දක්වා, ඔහු එසේ මිය ගිය දිනවන විට ලැබූ විටුපට සමාන විශ්‍රාම වැටුපක් ලැබීමටත්, එකී විශ්‍රාම යාමේ දිනයෙන් පසු මේ පනතේ විධිවිධාන අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබූමටත් හිමිකම සලසනු ලැබේ.

(2) හදිසි නීති නියෝග යටතේ වරදක් සංයුක්ත කරනු ලබන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් සේවයේ නියුක්තව සිටිය දී මිය යන රජයේ සේවයේ අනියම් සේවකයකුගේ වැන්දඹුවට හා දරුවන්ට එකී තැනැත්තා මිය ගිය දින සිට ඔහු එසේ මිය ගිය දින වන විට ලබමින් සිටි ගෙවීමට සමාන ගෙවීමක්, ඔහු ජීවත්වූයේ නම් ඔහුට වයස අවුරුදු පනස් පහ එළඹෙන දින දක්වා ලැබීමටත්, වයස අවුරුදු පනස්පහ ඉක්ම වූ පසු, මේ පනතේ විධි විධානවලට අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමටත් හිමිකම් සලසනු ලැබේ.

(ආ) 27ආ අලුත් වගන්තිය මගින් විශ්‍රාම වැටුප් සංග්‍රහයේ ට උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිලධරයකුගේ වැන්දඹුවට එකී නිලධරයාගේ මරණින් පසු ඔහු විශ්‍රාම යාමේ දී ලබන ලද වැටුප මත ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට විධිවිධාන සලසනු ලබයි.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරන ලබන අතර සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතිය බලපෑම වන්නේ වයස අවුරුදු 26 ට අඩු ගැහැණු අනත් දරුවකුට ඇයගේ පියාගේ මරණින් පසු, ඇය විවාහක ස්ත්‍රීයක වූව ද විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම සැලසීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පරිච්ඡින්න කොට අලුත් වගන්තියක් ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන අතර, අලුත් වගන්තියේ නීතියේ බලපෑම වන්නේ සිවකීය ස්වාමිපුරුෂයාගේ අවැමෙන් පසු විශ්‍රාම වැටපක් ලබමින් සිටින වැන්දඹුවක නැවත විවාහ වූ විටක එකී විශ්‍රාම වැටුපෙන් භාගයක් ලැබීමටත්, යම් හෙයකින් එකී නැවත විවාහක අවලංගු වූ විටකදී වුව ද, එහි කොටසක් නොවන ලෙසටත් එකී දෙවන විවාහය නිසා ඇයට අහිමි වූ කොටස පළමු විවාහයේ දරුවන්ට ලැබීමටත් විධිවිධාන සැලසීම වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට අලුත් උපවගන්තියක් එකතු කරන අතර එකී අලුත් උපවගන්තියේ නීතියේ බලපෑම වන්නේ විශ්‍රාම ගැනීමේ නියමිත දින සිට පෙර ධුරය අහෝසි කිරීම මත රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලබන සහ අරමුදලට දායක මුදල් ගෙවීම නතර කරනු ලැබූ රජයේ නිලධරයකුහට විශ්‍රාමයාමේ දිනයෙන් පසු ඔහු විසින් ඇතුළත් වන විවාහයක් සම්බන්ධයෙන් දායක මුදල් ගෙවීම ආරම්භ කිරීමට සැලසීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වන වගන්තිය පරිච්ඡින්න කොට ඒ වෙනුවට අලුත් වගන්තියක් ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන අතර, සංශෝධනයේ නීතියේ බලපෑම වන්නේ, නියමිත දින හෝ ඊට පසු දායකයකු වන රජයේ නලධරයකු වසර දහයක් හෝ ඊට වැඩි කාලයක් සේවය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපකට හිමිකම නොලබා රජයේ සේවය හැර ගිය විටක, ඔහුගේ මරණින් පසු ඔහු විසින් අරමුදලට ගෙවන ලද දායක මුදල් මත පදනම් වූ විශ්‍රාම වැටුපකට ඔහුගේ වැන්දඹුව සහ දරුවන්ට හිමිකම ලබාදීම වේ.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්

(අ) අරමුදලේ දායකයකු වූ රජයේ නිලධරයකු මේ පනතේ 27අ වගන්තියේ () වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතුමත මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර මියගිය විටක ඔහුගේ වැන්දඹුව හා දරුවන්ට එකී (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමට සලසනු ලබයි සහ

(ආ) රජයේ සේවයේ තාවකාලික හෝ අනියම් සේවකයකු ලෙස ධුර දරමින් සිට සේවයේ සිටියදීම, මේ පනතේ 27අ වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතුමත, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර මියගිය විටක, ඔහුගේ වැන්දඹුවට හා දරුවන්ට එකී (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමට සලසනු ලබයි.

***9 වන වගන්තිය*** : මේ වගන්තිය මේ පනතේ 8 වන වගන්තියේ කරන ලද සංශෝධනයට ආනුශංගික වේ.

***10 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් මේ පනතේ 5, 6 සහ 7 වන වගන්තිවල විධිවිධාන අතීතයට බලපෑමට සලසනු ලබන්නේ ය.

# ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති

එල්.ඩී.—ඕ. 17බ /2011.

**ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක කිරීම පිණිස ද: උත්තේජක ද්‍රව්‍ය මර්දන නියෝජ්‍යායතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම මගින් එකී සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඉහත කී සම්මුති රාමුව තුළ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිවීම සඳහා අදාළ දේශීය නීතිමය යාන්ත්‍රනයක් නිශ්චිතවම සඳහන් කිරීම පිණිස ද: ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව.

(මෙහි මින්මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව ජාත්‍යන්තර සම්මුතියක් දෙදහස් පහ වර්ෂයේ ඔක්තෝබර් මස දහනව වන දින පැරිස් නුවර දී එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ (යුනෙස්කෝ) මහ සමුළුවේ දී පිළිගනු ලැබ ඇති හෙයින් ද:

වර්ෂ දෙදහස් එකොළහේ පෙබරවාරි මස විසිහතර වන දින ඉහත කී සම්මුතියට ශ්‍රී ලංකා රජය එකඟ වී ඇති හෙයින් සහ දෙදහස් එකොළහේ මාර්තු මස නවවන දින ප්‍රාප්ති පත්‍රය අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත භාර දී ඇති හෙයින් ද:

වර්ෂ දෙදහස් එකොළහේ මැයි මස පළමු වන දින සිට ඉහත කී සම්මුතිය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක භාවයට එළඹ ඇති හෙයින් ද:

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ බැඳීම්වලට බලාත්මකභාවයක් ලබා දීම සඳහා දේශීය නීතිමය විධිවිධාන පැනවීමට ශ්‍රී ලංකා රජයට අවශ්‍යව ඇති හෙයින් ද:

එම නිසා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මෙම පනත 2013 අංක   දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනත අදාළ වන තැනැත්තන්.

2. මේ පනතේ විධිවිධාන:—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතට අනුව පිහිටුවන ලද ජාතික ක්‍රීඩා සංගමයක සාමාජිකයන් වන සියලු තැනැත්තන්;

2—PL 007529—475 (2013/08)

(ආ) යම් ජාතික ක්‍රීඩා සංගමයක අනුබද්ධිත සාමාජිකයකු, සමාජයක්, කණ්ඩායමක්, සංගමයක් හෝ ලීගයක් වන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් වන තැනැත්තන්;

(ඇ) යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින් හෝ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් සංවිධානය කරනු ලබන, පවත්වනු ලබන, කැඳවනු ලබන හෝ බලය දෙනු ලබන කිසියම් ක්‍රීඩාවකට සහභාගි වන සියලු තැනැත්තන්;

(ඈ) පරිවාර පිරිස ඇතුළුව ඕනෑම මට්ටමක "ක්‍රීඩකයකුගේ පුහුණුවකට සම්බන්ධ වන සියලු තැනැත්තන්";

(ඉ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව පවත්වන ක්‍රීඩා ඉසව්වකට සහභාගි වන (බාලවයස්කාරයන් ද ඇතුළුව) සියලු තැනැත්තන්,

සම්බන්ධයෙන් අදාළ කරගත යුතු ය.

## I වන කොටස

### වැරදි

3\. (1) යම් තැනැත්තකු— වැරදි.

(අ) ක්‍රීඩකයකු මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කර ඇති තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් ගැනීමට පොළඹවන්නේ නම්, සපයනු ලබන්නේ නම් හෝ හසුරුවනු ලබන්නේ නම් හෝ තහනම් කරන ලද කිසියම් ක්‍රමයක් භාවිත කරනු ලබන්නේ නම් හෝ යොදාගනු ලබන්නේ නම්;

(ආ) ඒවායේ ඇති පරිවෘත්තීය කාරක හෝ ඒවායේ ඇති සලකුණු කාරක පිළිබඳ යම් ක්‍රීඩකයකුගේ සාම්පලයක් මගින් පොළඹවා ගන්නේ නම් හෝ හඳුන්වා දෙන්නේ නම්;

(ඇ) තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද කිසියම් ක්‍රමයක් ක්‍රීඩාව සඳහා යොදා ගන්නා කිසියම් සත්වයකු සඳහා භාවිත කරන්නේ නම්;

(ඈ) මෙම පනත යටතේ වරදක් සිදු කිරීමේ අදහසින් තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද කිසියම් ක්‍රමයක් ක්‍රීඩාවේ යෙදීමේ දී තමා සන්තකයේ තබා ගන්නේ නම්;

(ඉ) තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද කිසියම් ක්‍රමයක් ක්‍රීඩාවේ යෙදීමේ දී කුට්ටනය කිරීමේ යෙදී සිටින්නේ නම්;

ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

"කුට්ටනය කිරීම" යන්නෙන්,

(i) විකිණීම, ලබා දීම, ප්‍රසම්පාදනය කිරීම, ප්‍රවාහනය කිරීම, යැවීම, භාර දීම හෝ බෙදා හැරීම; හෝ

(ii) (i) වන ඡේදයේ දැක්වෙන ඕනෑම දෙයක් කිරීම සඳහා අර්පණය කිරීම,

අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ අර්ථානුකූලව වරදක්:—

(අ) සිදු කිරීමට ප්‍රයත්න දරන;

(ආ) වරද සිදු කිරීමේ දී ආධාර දෙන සහ අනුබල දෙන;

(ඇ) වරද සිදු කිරීම සඳහා වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් සමග කුමන්ත්‍රණය කරන;

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

මේ උපවගන්තියේ—

"ආධාර දීම හෝ අනුබල දීම" යන්නට, දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන වගන්තියේ පරිදි එම අර්ථයම තිබිය යුතු ය.

"කුමන්ත්‍රණය කිරීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 113අ වගන්තියේ පරිදි එම අර්ථයම තිබිය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු අධිචෝදනාවක්

මත මහාධිකරණය විසින් වරදකට වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු අතර, රුපියල් ලක්ෂ පහකට නොඅඩු සහ රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට ද යටත් විය යුතු ය. වරදකරු කරනු ලැබූ තැනැත්තා ක්‍රීඩකයාගේ පරිවාර පිරිසේ සාමාජිකයකු වන විට ඔහුගේ ක්‍රියාකාරකම් පිළිබඳව නිශ්චිත වසර ගණනක් සඳහා තහනමක් පැනවිය හැකි ය.

මේ පනත යටතේ වැරදි මහාධිකරණය මගින් විභාග කළ යුතු බව.

**4.** (1) කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකා මහාධිකරණයට හෝ බස්නාහිර පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පළාත්බඳ මහාධිකරණයට, වෙනත් යම් නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ වැරදි විභාග කිරීම සඳහා අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිදු කරන අවස්ථාවක දී:—

(අ) ඒ ක්‍රියාව සිදු කළ තැනැත්තා දැනට ශ්‍රී ලංකාවේ සිටී නම්;

(ආ) ශ්‍රී ලංකා පුරවැසියකු විසින් ඒ ක්‍රියාව සිදු කර ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරවන ගුවන් යානයක් තුළ දී ඒ ක්‍රියාව සිදු කර ඇත්නම්;

(ඈ) වරද සිදුකරනු ලැබ ඇතැයි චෝදනා ලබා ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම්,

ඒ වරද ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලැබූ ලෙස විභාග කිරීමට (1) වන උපවගන්තිය යටතේ සඳහන් කරන ලද මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

## II වන කොටස

### චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය

චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය.

**5.** (1) (මෙහි මින් මතු "ටීයූඊ" යනුවෙන් සඳහන් කරනු ලබන) චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය, 10 වන වගන්තිය යටතේ

ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා උත්තේජක ද්‍රව්‍ය මර්දන නියෝජ්‍යායතනය විසින් ක්‍රීඩකයකුට ක්‍රීඩා ඉසව්වකට සහභාගිවන විට තහනම් කළ ද්‍රව්‍යයක් හෝ තහනම් කළ ක්‍රමයක් භාවිත කිරීමට අවසර දෙමින් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) එකී චිකිත්සක භාවිත මුක්තියක් (ටීයූඊ) තමා වෙනුවෙන් ලබා ගැනීම අවශ්‍ය කරනු ලබන ක්‍රීඩකයකු විසින් නියෝග මගින් නියම කර ඇති ආකෘතියෙන්, ටීයූඊ ප්‍රදානය කරන මෙන් ඉල්ලා සිටින අයදුම්පත්‍රයක් අනුමතය අවශ්‍යවන්නා වූ දිනයට පෙරාතුව දින තිහකට නොඅඩු කාලසීමාවක දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ඉදිරිපත් කළ යුතු ය. ක්‍රීඩකයා විසින් එම ඉල්ලුම්පත්‍රය සමග තහවුරු කිරීම සඳහා අවශ්‍ය අදාළ සියලුම වෛද්‍ය සහතික සහ ලේඛණ ඉදිරිපත් කළ යුතු ය.

(3) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) සලකා බැලීම සඳහා සහ ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණා, ක්‍රියාපටිපාටි හෝ ලේඛන නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකිය

චිකිත්සක භාවිත මුක්තියක් (ටීයූඊ) ප්‍රදානය කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටිය.

**6.** (1) උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 5 වන වගන්තියට අනුකූලව ක්‍රීඩකයකුගෙන් චිකිත්සක භාවිත මුක්තියක් (ටීයූඊ) ප්‍රදානය සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් ලැබුණු පසුව උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඒ ඉල්ලුම්පත්‍රය, එම කාර්ය සඳහා නියෝජ්‍යායතනය විසින් පිහිටුවනු ලැබිය යුතු සහ පත් කරනු ලැබිය යුතු (මෙහි මින්මතු "ටීයූඊ කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) ''චිකිත්සක භාවිත මුක්තිය පිළිබඳ කමිටුව" වෙත සමාලෝචනය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(2) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) පිළිබඳ කමිටුව, සායනික ක්‍රීඩා සහ ව්‍යායාම වෛද්‍ය විද්‍යාව පිළිබඳ පළපුරුද්දක් දරන තැනැත්තන් අතුරෙන් පත් කරනු ලබන සාමාජිකයන් තුන්දෙනකුට නොඅඩු ගණනකින් සමන්විත විය යුතු ය. සාමාජිකයන් විසින් තමා පත් කරන අවස්ථාවේ දී ම, කිසියම් සම්බන්ධතා ඝට්ටනයක් පවතීනම් ඒ පිළිබඳව අනාවරණය කළ යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉන් පසුව ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කිරීමට පියවර ගත යුතු ය.

(3) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) පිළිබඳ කමිටුව විසින්—

(අ) තීව්‍ර හෝ නිදන්ගත රෝගී තත්ත්වයක් සඳහා වන ප්‍රතිකාර ක්‍රියාවලියක දී තහනම් කරන ලද ද්‍රව්‍ය හෝ තහනම් කරන ලද ක්‍රම ලබාදීම වළක්වනු ලැබ ඇත්නම්, ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ක්‍රීඩකයාට සෞඛ්‍ය පිළිබඳ උග්‍ර දුබලතාවයකට ඒ මත මුහුණ දීමට සිදුවේ නම් පමණක්;

(ආ) නීත්‍යානුකූල රෝගී තත්ත්වයක් සඳහා ප්‍රතිකාර ලබාගැනීමෙන් පසුව යම් ක්‍රීඩකයකු ආපසු සාමාන්‍ය සෞඛ්‍ය තත්වයකට පැමිණවිය හැකි වන්නා වූ ක්‍රියාකාරිත්වයේ වර්ධනයක් හැර තහනම් කළ ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීමෙන් කිසිදු අතිරේක ක්‍රියාකාරිත්ව වර්ධනයක් සිදු නොවන බවට අදාළ ක්‍රීඩකයා විසින් කමිටුව සෑහීමකට පත්වන අයුරින් තහවුරු කර ඇත්නම් පමණක්:

එසේ වුව ද, කිසියම් ඇතුළතින් හටගත් හෝමෝනයක සාමාන්‍ය අඩු මට්ටම වැඩි කිරීම සඳහා භාවිත කරන තහනම් කළ යම් ද්‍රව්‍යයක් හෝ තහනම් කළ යම් ක්‍රමයක් පිළිගත හැකි චිකිත්සක මැදිහත්වීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ඇ) තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීම හැර අවස්ථානුගත කරුණු අනුව ක්‍රීඩකයකු සඳහා සාධාරණ චිකිත්සක විකල්පයක් නොමැති; සහ

(ඈ) තහනම් කරන ලද ද්‍රව්‍ය හෝ තහනම් කරන ලද ක්‍රමය භාවිතා කිරීමේ අවශ්‍යතාව, ඊට පෙර චිකිත්සක භාවිත මුක්තියක් ලබාගැනීමෙන් තොරව තහනම් කරනු ලැබ තිබූ යම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීම හේතුවෙන් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ඇති වූ තත්ත්වයක් නොවන විට,

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට චිකිත්සක භාවිත මුක්තියක් (ටීයූඊ) ප්‍රදානය කිරීමට නිර්දේශ කළ යුතු ය.

(4) කමිටුව විසින් ස්වකීය තීරණයට එළඹීමේ දී "චිකිත්සක භාවිත මුක්තිය පිළිබඳ කමිටුවේ තීරණයන්ට සහාය වන වෛද්‍ය තොරතුරු" යන නමින් සහ රෝග විනිශ්චයට සහ ප්‍රතිකාරවලට මෙන්ම චිකිත්සක භාවිත මුක්තිය වලංගු කාලසීමාව සම්බන්ධයෙන් වූ හේතු ඵල අන්තර්ගත ලේඛනයේ ඇතුළත් කර ඇති (මෙහි මින්මතු "WADA" යනුවෙන් සඳහන් කරනු ලබන) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ චිකිත්සක භාවිත මුක්තිය සඳහා වන ජාත්‍යන්තරව පිළිගත් සම්මත විධිවිධානවලින් මෙහෙයවනු ලැබිය යුතු ය.

(5) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) පිළිබඳ සහාය කර ගැනීම පිණිස තිබෙන සාක්ෂි සහ ලේඛන සැලකිල්ලට ගනිමින් චිකිත්සක භාවිත මුක්තිය පිළිබඳ කමිටුව (ටීයූඊ) විසින් ඉල්ලා සිටින ලද චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කිරීම නිර්දේශ කරන්නේ ද නැතහොත් ඉල්ලා සිටින ලද චිකිත්සක භාවිත මුක්තිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න පිළිබඳ එම කමිටුවේ නිර්දේශය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ඉදිරිපත් කළ යුතු ය. චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) පිළිබඳ කමිටුව විසින් ඒ නිර්දේශය ඉදිරිපත් කිරීමේ දී එහි තීරණයට හේතු වූ කරුණු දැක්විය යුතු ය.

චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) නිකුත් කිරීම.

7. (1) කමිටුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ඉදිරිපත් කළ නිර්දේශය ලැබුණු පසුව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමතය ලබාදීම සහ ටීයූඊ නිකුත් කිරීම හෝ හේතු දක්වමින් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතු ය.

(2) ටීයූඊ ප්‍රදානය කිරීම සිදු කරන ලද තහනම් කරන ලද ද්‍රව්‍ය හෝ තහනම් කරන ලද ක්‍රමය සහ අනෙකුත් කිසියම් කොන්දේසි සමඟ එසේ ප්‍රදානය කළ එම මුක්තිය අදාළ වන කාලපරිච්ඡේදය ටීයූඊ මගින් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

චිකිත්සක භාවිත මුක්තියක් (ටීයූඊ) අවලංගු කිරීම.

8. පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුකූලව ප්‍රදානය කළ චිකිත්සක භාවිත මුක්තියක්:—

(අ) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කර ඇත්තේ යම් ක්‍රීඩකයකු වෙත ද, ඒ ක්‍රීඩකයා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදානය කරනු ලැබ ඇති

චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) යටත් වන්නා වූ අවශ්‍යතා හෝ කොන්දේසි කිසිවකට නොපමාව අනුකූල නොවන්නේ නම්;

(ආ) චිකිත්සක භාවිත මුක්තිය ප්‍රදානය කරන ලද කාල සීමාව ඉකුත් වී ඇත්නම්; හෝ

(ඇ) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කිරීම පිළිබඳ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ තීරණය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් වෙනස් කිරීමකට යටත් කර ඇත්නම්,

අවලංගු කරනු ලැබිය යුතු ය.

චිකිත්සක භාවිත මුක්තිය අදාළවන කාලසීමාව දීර්ඝ කිරීම.

**9.** ප්‍රදානය කරනු ලැබ ඇති චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) සඳහා වූ කාල සීමාව අවසානයේ චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කරනු ලැබූ තහනම් කරන ලද ද්‍රව්‍යය හෝ තහනම් කරන ලද ක්‍රමය භාවිත කිරීමට ක්‍රීඩකයකුට තවදුරටත් අවශ්‍ය වන්නේ නම් ඉහත දක්වා ඇති ආකාරයෙන් වූ ඉල්ලුම්පත්‍රයක් තවදුරටත් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටුවීම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටුවීම.

**10.** (1) මේ පනතේ විධිවිධානවලට අනුකූලව (මෙහි මින්මතු "නියෝජ්‍යායතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු නියෝජ්‍යායතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) නියෝජ්‍යායතනය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

නියෝජ්‍යායතනයේ පරමාර්ථ.

**11.** නියෝජ්‍යායතනයේ පරමාර්ථ විය යුත්තේ:—

(අ) ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ගැනීම පිටු දැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම;

(ආ) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම පිළිබඳ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍යායතනය හා සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යෝන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

නියෝජ්‍යායතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

**12.** නියෝජ්‍යායතනයට, එහි පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා සහ එයට පවරන ලද කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ බලතල තිබිය යුතු අතර විශේෂයෙන් පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සිදු කිරීමට බලතල තිබිය යුතු ය:—

(අ) උත්තේජක මර්දන ක්‍රියා සැලසුම් කිරීමට, සම්බන්ධීකරණය කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට;

(ආ) උත්තේජක මර්දන උල්ලංඝනය කිරීම්වලට එරෙහිව පියවර ගැනීමට;

(ඇ) යම් චංචල හෝ නිශ්චල දේපළක් (විකිණීමෙන්, ත්‍යාග මගින් හෝ අන්‍යාකාරයකින්) අත්කර ගැනීමට, දැරීමට, බද්දට හෝ කුලියට ගැනීමට හෝ දීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට සහ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට;

(ඈ) කිසියම් බැංකුවක ජංගම ගිණුම් සහ ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාමට;

(ඉ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමට;

(ඊ) නියෝජ්‍යායතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ඉටු කිරීමට;

(උ) නියෝජ්‍යායතනයට අයිති මුදල් කිසිවක් ආයෝජනය කිරීමට;

(ඌ) එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් ණයට ලබා ගැනීමට;

(එ) මේ පනත යටතේ නියෝජ්‍යායතනයේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, ඔවුන් සේවයේ නියුක්ත කිරීමට, පාරිශ්‍රමික ලබා දීමට සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට සහ ඒ නිලධරයන් සහ සේවකයන් සේවයෙන් ඉවත් කිරීමට;

(ඒ) නියෝජ්‍යායතනය විසින් සපයන ලද සේවා සහ සහාය වෙනුවෙන් ගාස්තු අය කිරීමට; සහ

(ඔ) එහි කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය යයි නියෝජ්‍යායතනය අදහස් කරන වෙනත් යම් සියලු දේ සිදුකිරීමට.

13. (1) නියෝජ්‍යායතනයේ කටයුතු, පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

නියෝජ්‍යායතනයේ පරිපාලනය මණ්ඩලය වෙත පැවරිය යුතු බව.

(2) නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්, මේ පනත මගින් නියෝජ්‍යායතනය වෙත පවරන ලද හෝ ඒ මත පනවන ලද හෝ එයට භාරදෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදුකිරීම කළ යුතු ය.

14. (1) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්, එනම්—

මණ්ඩලයේ සංයුතිය.

(අ) නිලබලයෙන් පත්කල සාමාජිකයන්ගෙන්—

(i) ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාගේ නිලයට වඩා අඩු නොවන ධුරයක් දරන නිලධරයකුගෙන්;

(ii) ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ-ජනරාල්වරයා,;

(iii) ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(iv) ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද නීතිය, ක්‍රීඩා වෛද්‍ය සහ ක්‍රීඩා විද්‍යාව යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත් වූ (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, පත්කළ සාමාජිකයන්ගෙන් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය. එසේ පත් කළ සභාපතිවරයා විසින් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ අවස්ථාවෝචිත පරිදි පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු වශයෙන් පත්ව සිටී නම් හෝ පත්වේ නම්;

(ආ) නියෝජ්‍යායතනය විසින් හෝ ඒ වෙනුවෙන් සාදන ලද යම් ගිවිසුමක් යටතේ අයිතිවාසිකම් හෝ වරප්‍රසාද කිසිවක් ඍජුවම හෝ අන්‍යාකාරයෙන් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(ඇ) මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ඔහු විසින් ස්වකීය කර්තව්‍යයන් ඉටු කිරීමේ දී අගතිගාමී ලෙස බලපෑමක් ඇතිවිය හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් ඇත්නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

**15.** නියෝජ්‍යායතනයේ පරමාර්ථවලට සම්බන්ධ යම් කාරණයක් හෝ සියලු කාරණා පිළිබඳව ද අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ උපදෙස් සඳහා යොමු කරනු ලබන යම් කාරණයක් පිළිබඳව ද අමාත්‍යවරයාට උපදෙස් දීම මණ්ඩලයේ කාර්ය විය යුතු ය. මණ්ඩලයේ කාර්යයන්.

*මණ්ඩලය වෙත විශේෂ හෝ පොදු විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.*

**16.** මණ්ඩලයේ බලතල ක්‍රියාවේ යෙදවීම සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් කලින් කලට විශේෂ හෝ පොදු විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

*පත්කළ සාමාජිකයන්ගේ ධුර කාලය.*

**17.** (1) මණ්ඩලයේ පත්කල සාමාජිකයකු ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍ය බව අමාත්‍යවරයා සලකන්නේ නම්, අමාත්‍යවරයා විසින්, හේතු දක්වා ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ පත්කල සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ඔහුගේ ධුරයෙන් කවර හෝ වේලාවක දී ඉල්ලා අස්විය හැකි ය.

(4) යම් පත් කළ සාමාජිකයකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී ඒ පුරප්පාඩුව පිරවීම සඳහා 14 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) පත් කළ සාමාජිකයකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබූ අවස්ථාවක එසේ පත්කළ තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(6) යම් පත් කළ සාමාජිකයකු රෝගාතුර වීම, අබලතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා මාස තුනකට නොඅඩු කාලසීමාවක් සඳහා තාවකාලිකව ඔහුගේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක 14 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට, නිවාඩු නොලබා නොපැමිණ සිටින යම් පත්කළ සාමාජිකයකු, ඔහුගේ ධුරය හැරගියා සේ සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

18 (1) සභාපතිවරයා හෝ සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක උපසභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා හා උපසභපතිවරයා පැමිණ නොසිටියහොත් ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීමෙහි මුලසුන දැරීම සඳහා ඔවුන් අතරෙන් සාමාජිකයකු නම් කළ යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක දී ලැබෙන ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක,සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම් සභාපතිවරයා විසින් කැඳවනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ නියෝජ්‍යායතනයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වාර ගණනක් පවත්වනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(5) මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව යම් සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් පැවැත්වීම පිළිබඳ සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව නියෝජ්‍යායතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**19.** අල්ලස් පනතේ අර්ථානුකූලව නියෝජ්‍යායතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

නියෝජ්‍යාතනයේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් විය යුතු බව.

**20.** නියෝජ්‍යායතනයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත්කිරීමෙහි ලා දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ කටයුතු නිර්බල නොවිය යුතු බව.

**21.** මණ්ඩලයේ සාමාජිකත්වයෙහි යම් පුරප්පාඩුවක් තිබුණ ද මණ්ඩලයට 17 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ක්‍රියාකිරීමට බලය ඇති අතර, එවැනි යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත්කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

**22.** (1) මණ්ඩලය විසින් වෛද්‍ය හෝ ක්‍රීඩා වෛද්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වයට පත් වූ යෝග්‍ය සහ උචිත තැනැත්තකු නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත්කළ යුතු අතර, ඔහු වසර තුනක කාල සීමාවක් සඳහා නියෝජ්‍යායතයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, ඔහු නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, මණ්ඩලය විසින් ඔහුට පවරනු ලැබිය හැකි යම් බලතල, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා හට ස්වකීය බලතල සහ කාර්ය, මණ්ඩලයේ කිසියම් සාමාජිකයකු වෙත පැවරීම කළ හැකි ය.

කමිටු සහ මූල මණ්ඩල පිහිටුවීම.

**23.** (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ කර්තව්‍ය කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් කමිටු සහ මූල මණ්ඩල

සංඛ්‍යාවක් පත්කරනු ලැබිය හැකි අතර එවැනි යම් කමිටුවක හෝ මූල මණ්ඩලයක සාමාජිකයන් වශයෙන් පත් කර ගැනීම සඳහා යෝග්‍ය යයි සලකනු ලබන යම් තැනැත්තන් ඒ සඳහා පත්කළ හැකි ය.

(ආ) මණ්ඩලය විසින් ඒ කමිටුව හෝ මූල මණ්ඩලය වෙත කරන ලද යොමු කිරීමේ නියමයන්හි සඳහන් කර ඇති පරිදි කමිටුවක් හෝ මූල මණ්ඩලයක් විසින් එහි කර්තව්‍ය කරගෙන යාම සහ එහි බැඳීම් ඉටු කිරීම කළ යුතු ය.

(ඇ) මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකන අවස්ථාවක දී සලකා බලනු ලබන විශේෂිත කාරණයක් අවසන් කිරීමේ කාර්යය සඳහා අදාළ ක්ෂේත්‍රවල අවශ්‍ය දැනුම සහ නිපුණතාවයක් දරන යම් තැනැත්තකු සාමාජිකයකු ලෙස කමිටුවට හෝ මූල මණ්ඩලයට අනුයුක්ත කර ගනු ලැබිය හැකිය. ඒ තැනැත්තා ස්ථිර සාමාජිකයකු නොවිය යුතු අතර එහි කටයුතු සිදු කිරීමේ දී පැන නැගිය හැකි යම් ගැටළුවක් සම්බන්ධයෙන් ඔහුට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතියක් නොතිබිය යුතු ය.

(ඈ) යම් කමිටුවක හෝ මූල මණ්ඩලයක සාමාජිකයන්ගේ ධුර කාලය වසර හතරක් විය යුතු ය.

(ඉ) යම් කමිටුවක හෝ මූල මණ්ඩලයක සාමාජිකයකු මියයන හෝ ඉල්ලා අස්වන අවස්ථාවක දී මණ්ඩලය විසින් මියගිය හෝ ඉල්ලා අස්වූ තැනැත්තා වෙනුවට වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, ඒ සාමාජිකයා වෙනුවට එසේ පත් කරන ලද සාමාජිකයකු විසින් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති ධුර කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

(ඊ) යම් කමිටුවක හෝ මූල මණ්ඩලයක සාමාජිකයකු තවත් වසර හතරක කාලසීමාවක් සඳහා පමණක් නැවත පත් කරනු ලැබිය හැකි ය.

(උ) වෛද්‍ය වෘත්තිකයකු හා ක්‍රීඩා පරිපාලකයකු එවැනි සෑම කමිටුවකම හෝ මූල මණ්ඩලයකම ඇතුළත් විය යුතු ය. එවැනි සෑම සාමාජිකයකු විසින් කමිටුවේ හෝ මූල මණ්ඩලයේ තීරණවල අපක්ෂපාතීභාවයට බලපෑ හැකි එම සාමාජිකයාගේ යම් සම්බන්ධතාවක් පිළිබඳව හෙළිදරව් කළ යුතු ය.

(ඌ) කමිටුව හෝ මූල මණ්ඩලය විසින් කිසියම් විභාග කිරීමක දී කමිටුව හෝ මූල මණ්ඩලයට සහාය වීම හා උපදෙස් ලබාදීම සඳහා එක් එක් අවස්ථාවක් සම්බන්ධයෙන් ප්‍රවීණයකු පත් කරනු ලැබිය හැකිය.

(එ) ජාතික නියෝජ්‍යායතනය, ජාත්‍යන්තර සම්මේලනය, ජාතික ක්‍රීඩා සංගමය, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ක්‍රීඩකයා හෝ පරිවාර පිරිසේ සාමාජිකයකුට නිරීක්ෂකයන් ලෙස පෙනී සිටීමට සහ විනය මූල මණ්ඩලයේ විභාග කිරීම්වලට සහභාගීවීමට අයිතිවාසිකම් තිබිය යුතු ය.

(ඒ) ක්‍රීඩකයකුට හෝ පරිවාර පිරිසේ යම් සාමාජිකයකුට විභාග කිරීමක් පිළිබඳ තම අයිතිය ලිඛිතව දැනුම් දීමෙන් අත්හැර දැමිය හැකිය. එම ක්‍රීඩකයා හෝ අදාළ තැනැත්තා විසින් එම ලිපිය මගින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිගත යුතු අතර, එම උල්ලංඝනය කිරීම හා සම්බන්ධව නියම කර ඇති එහි ප්‍රතිඵල භාරගන්නා බවට එහි සඳහන් කළ යුතු ය.

(ඔ) මේ වගන්තියේ නියමයන්ට අනුව සෑම විභාග කිරීමක්ම කමිටුව හෝ මූල මණ්ඩලය විසින් එහි විභාග කිරීම් ආරම්භ කරන ලද දින සිට මාස තුනක කාලසීමාවක් ඉකුත්වීමට පෙරාතුව හැකිතාක් ඉක්මණින් අවසන් කරනු ලැබිය යුතු ය.

(ඕ) විභාග කිරීමකින් පසු එහි නිගමනය පිළිබඳ කමිටුවේ හෝ මූල මණ්ඩලයේ තීරණය ලියවිල්ලකින් ලබාදිය යුතු අතර එක් එක් කමිටුවේ හෝ මූල මණ්ඩලයේ සාමාජිකයන් තුන් දෙනෙකු විසින් අත්සන් කර දිනය යෙදිය යුතු ය. මෙම තීරණය සමග එකඟ නොවන අවස්ථාවක දී එකඟ නොවන සාමාජිකයා විසින් කමිටුවේ හෝ මූල මණ්ඩලයේ තීරණයේ කොටසක් ලෙස එවැනි එකඟ නොවීමක් සඳහා ස්වකීය හේතු සඳහන් කළ යුතු ය.

(ඛ) කමිටුවේ හෝ මූල මණ්ඩලයේ සෑම තීරණයකම ඒ හා සම්බන්ධ ක්‍රීඩකයාට හෝ අදාළ තැනැත්තාට අදාළ වන ප්‍රතිඵල පිළිබඳව පැහැදිලි කිරීමක් ඇතුළත් විය යුතු ය.

(ග) කමිටුවේ හෝ මූල මණ්ඩලයේ සෑම තීරණයක්ම හැකි පහසු ඉක්මණින් ක්‍රීඩකයා හෝ පරිවාර පිරිසේ යම් සාමාජිකයකුට, නියෝජ්‍යායතනය, ජාත්‍යන්තර සම්මේලනය, ජාතික ක්‍රීඩා සංගමය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ඝ) මේ වගන්තිය යටතේ වන විභාග කිරීම් සම්බන්ධයෙන් කමිටුව හෝ මූල මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සඳහන් කරමින් රීති සාදනු ලැබිය හැකිය.

(2) (මෙහි මින්මතු "විනය මූල මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා උත්තේජක මර්දන විනය මූල මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මූල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) ක්‍රීඩා විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාගේ නිලයට වඩා අඩු නොවන ධුරයක් දරන සභාපතිවරයා විය යුතු නිලධරයකු;

(ආ) අධිකරණයේ පෙනී සිටීම පිළිබඳ වසර පහකට වැඩි පළපුරුද්දක් ඇති නීතිඥවරුන් අතරින් උපසභාපති විය යුතු තැනැත්තන් දෙදෙනකු;

(ඇ) ක්‍රීඩා වෛද්‍ය ක්ෂේත්‍රයේ වසර පහකට වැඩි පළපුරුද්දක් ඇති වෛද්‍ය වෘත්තිකයන් අතරින් තැනැත්තන් තිදෙනෙකු ;

(ඈ) ක්‍රීඩා පරිපාලනය පිළිබඳව පූර්ව පළපුරුද්දක් ඇති තැනැත්තන් තිදෙනකු.

## IV වන කොටස

### උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන විනයානුකූල ක්‍රියා පටිපාටිය සහ අභියාචනා ක්‍රියා පටිපාටිය

උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කරන අවස්ථා.

**24.** 23 වන වගන්තිය යටතේ පත් කරන ලද විනය මූල මණ්ඩලය විසින්, උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීම පිළිබඳව සිදුකරන ලද කිසියම් විමර්ශනයක තීරණය පදනම් කරගෙන, මණ්ඩලය විසින්—

(අ) උත්තේජක පිළිබඳ තාවකාලික තහනමක් හා ඒ පිළිබඳ තාවකාලික විභාග කිරීමක් සමග එම චෝදනාව මත පදනම්ව ක්‍රීඩකයකු සම්බන්ධයෙන් අසතුටුදායක විශ්ලේෂණ තීරණයක් පවතී නම්;

(ආ) අක්‍රමවත්භාවයක් නිසා සාම්පල පරීක්ෂණය වලංගු නොවන බවට ප්‍රකාශ කරනු ලැබ නොමැති නම්;

(ඇ) ඉදිරිපත් කරන තහනම් කරන ලද ද්‍රව්‍ය මේ පනතේ නියමයන්ට අනුව ක්‍රීඩකයාට ප්‍රදානය කරන ලද චිකිත්සක භාවිත මුක්තියට (ටීයූඊ) අනුකූල නොවේ නම්;

(ඈ) බී සාම්පලයේ විශ්ලේෂණයෙන් ඒ සාම්පලයේ තීරණය තහවුරු වන්නේ නම් හෝ ක්‍රීඩකයා විසින් බී සාම්පලයේ විශ්ලේෂණයක් ඉල්ලා නොමැති නම්;

(ඉ) සියලු පසු විමර්ශන තුළින් ක්‍රීඩකයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීම පිළිබඳ පැහැදිලි නිගමනයකට මුල් වන්නේ නම්; සහ

(ඊ) වැඩි දුරටත් වූ විමර්ෂන සඳහා අවශ්‍ය වන උත්තේජක මර්දන පරීක්ෂණවල වලංගුභාවය පිළිබඳ තොරතුරු හෝ සාක්ෂි ක්‍රීඩකයා විසින් සපයා නොමැති නම්,

උත්තේජක - මර්දන රීතියක් උල්ලංඝනය කරනු ලැබ ඇති බව තහවුරු කරනු ලැබිය හැකි ය.

උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් මණ්ඩලය විසින් තහවුරු කර ඇත්නම් ගත යුතු පියවර.

**25.** (1) මණ්ඩලය විසින්, 24 වන වගන්තියේ නියමයන්ට අනුව උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් තහවුරු කර සිටින අවස්ථාවක දී අසතුටුදායක විශ්ලේෂණ තීරණය ගනු ලැබුවේ යම් ක්‍රීඩකයකු හෝ තැනැත්තකුට එරෙහිව ද ඒ ක්‍රීඩකයා හෝ තැනැත්තා වෙත සහ ජාතික උත්තේජක මර්දන ආයතනය, ජාත්‍යන්තර සම්මේලනය, ජාතික ක්‍රීඩා සංගමය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත, එම තහවුරු කිරීම ලිඛිතව දැනුම් දිය යුතු ය.

(2) මණ්ඩලය ද, එය විසින් එවැනි තහවුරු කිරීමක් කරනු ලබන අවස්ථාවක දී 23 වන වගන්තියේ නියමයන්ට අනුකූලව පිහිටුවන ලද ශ්‍රී ලංකා උත්තේජක මර්දන විනය මූල මණ්ඩලය වෙත ඒ පිළිබඳව දැනුම් දිය යුතු අතර, රීති මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් මාර්ගෝපදේශවලට අනුකූලව ශ්‍රී ලංකා උත්තේජක මර්දන විනය මූල මණ්ඩලය විසින් ඒ පිළිබඳව විභාගයක් පැවැත්විය යුතු බවට ඉල්ලා සිටිය යුතු ය.

(3) මණ්ඩලය විසින් ඉන් පසුව උල්ලංඝනය කිරීමට අදාළ වන්නා වූ සහ ඔවුන් සතුව පවතින සියලු ලේඛන ශ්‍රී ලංකා උත්තේජක - මර්දන විනය මූල මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

අභියාචනා.

**26.** (1) (අ) 23 වන වගන්තියේ නියමයන්ට අනුව විනය මූල මණ්ඩලයක තීරණයකින්; හෝ

(ආ) 5 වන වගන්තියේ නියමයන්ට අනුව ඉල්ලා සිටින චිකිත්සක භාවිත මුක්තියක් (ටීයූඊ) ක්‍රීඩකයකුට ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරමින් දෙනු ලබන නියෝජ්‍යායතනයේ තීරණයකින්

අතෘප්තියට පත් යම් ක්‍රීඩකයකු හෝ තැනැත්තකු විසින්, එම තීරණය ඔහු වෙත දැනුම් දෙනු ලැබීමෙන් සති දෙකක් ඇතුළත, අමාත්‍යවරයා විසින් පත් කරන ලද අභියාචනා මූල මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) අභියාචනා මූල මණ්ඩලයේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

(3) නියම කරනු ලැබිය හැකි උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමෙන් උද්ගතවන කාරණා සම්බන්ධයෙන් වූ අභියාචනා විභාග කිරීමට නීතිය සහ ක්‍රීඩා වෛද්‍ය යන ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වයක් පෙන්නුම් කරනු ලබන සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතු (මෙහි මින්මතු "අභියාචනා මූල මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) උත්තේජක මර්දන අභියාචනා මූල මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

අභියාචනා මූල මණ්ඩලය විසින් ගන්නා ලද අසතුටුදායක තීරණයක ප්‍රතිඵල.

**27.** (1) මේ පනතේ නියමයන්ට අනුව විභාග කිරීමකින් පසුව අභියාචනා මූල මණ්ඩලය විසින් ගන්නා සෑම තීරණයකදීම ඒ තීරණයෙන් අගතියට පත් පාර්ශවය විසින් එයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. එවැනි සෑම අභියාචනයක් ම ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය (CAS) වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එහි නීති සංග්‍රහයේ විධිවිධාන එයට අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) යම් ක්‍රීඩකයකු ශ්‍රී ලංකාවට අදාළවන උත්තේජක මර්දන රීතිවලට පටහැනිව ක්‍රියා කර ඇති බවට සොයාගනු ලැබ ඇති අවස්ථාවක දී එයට අදාළවන ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතන නීති සංග්‍රහයේ විධිවිධානවල නියමයන්ට අනුව ඒ ක්‍රීඩකයා සම්බන්ධයෙන් දඬුවම් කළ හැකි ය. උත්තේජක මර්දන රීතිවලට පටහැනිව ක්‍රියා කිරීමකට අදාළ කරගත හැකි ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතන නීති සංග්‍රහයේ ඇතුළත් කර ඇති දඬුවම් පිළිබඳව පැහැදිලි කරමින් රීති සාදනු ලැබිය හැකි ය.

## V වන කොටස

## මුදල්

**28.** (1) නියෝජ්‍යායතනට ස්වකීය අරමුදලක් තිබිය යුතු ය. අරමුදල.

(2) නියෝජ්‍යායතනයේ අරමුදලට-

(අ) නියෝජ්‍යායතනයේ භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි යම් සියලු මුදල්;

(ආ) නියෝජ්‍යායතනය විසින් එහි බලතල, කාර්ය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම වෙනුවෙන් නියෝජ්‍යායතනය විසින් ලබාගත හැකි සියලු මුදල් ; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් බැහැරව, කවරාකාරයේ හෝ යම් මූලාශ්‍රයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් නියෝජ්‍යායතනය වෙත ලැබෙන යම් සියලු මුදල්,

බැර කරනු ලැබිය යුතු ය.

(3) නියෝජ්‍යායතනයේ අරමුදලින්—

(අ) මේ පනත යටතේ නියෝජ්‍යායතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම වෙනුවෙන් නියෝජ්‍යායතනය විසින් දරන ලද වියදම් කිසිවක් පියවා ගැනීමට අවශ්‍ය කරන යම් සියලු මුදල්; සහ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අරමුදලෙන් ගෙවිය යුතු බවට නියම කර ඇති යම් සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

නියෝජ්‍යායතනයේ මුදල් වර්ෂය.

**29.** නියෝජ්‍යායතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

**30.** (1) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන නියෝජ්‍යායතනයේ ගිණුම් විගණනය කිරීමට සහ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ කරගත යුතුය.

(2) 1991 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සංස්ථාවේ මුදල් පාලනය හා ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VI වන කොටස

### සාමාන්‍ය

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි.

**31.** පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී, එවිට-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් නම් එවිට ඒ වරද සිදු කරන අවස්ථාවේ දී ඒ සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ සේවකයකු වශයෙන් සිටියේ යම් තැනැත්තකු ද ඒ සෑම තැනැත්තකුම; සහ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ආයතනයක් නම් ඒ වරද සිදු කරන අවස්ථාවේ දී ඒ ආයතනයේ හවුල්කරුවකුව සිටියේ යම් තැනැත්තකු ද ඒ සෑම තැනැත්තකුම;

ඔහුගේ අනුදැනුමකින් තොරව ඒ වරද සිදු කළ බවට හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට නිසි උද්‍යෝගයෙන් ක්‍රියාකළ බවට ඔහු විසින් ඔප්පු කරන්නේ නම් මිස ඒ වරද සිදු කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

වියදම් අරමුදලින් ගෙවිය යුතු බව.

**32.** (1) කිසියම් අධිකරණයක් ඉදිරියේ දී මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට එරෙහිව ඉදිරිපත් කරනු ලබන හෝ පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරනු ලබන වියදම් කිසිවක් නියෝජ්‍යායතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවිය යුතු හෝ මණ්ඩලය මගින් අයකරගත යුතු යම් මුදලක් නියෝජ්‍යායතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ යම් සේවකයකු විසින් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සද්භාවයෙන් ඒ තැනැත්තා විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් කිසියම් අධිකරණයක් ඉදිරියේ දී ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන ලද කිසියම් සිවිල් හෝ අපරාධ නඩුවක් වෙනුවෙන් දරන ලද යම් වියදමක්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා විසින් ඒ වියදම් අය කරගෙන ඇත්නම් මිස, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම

සද්භාවයෙන් කරනු ලැබූ බවට අධිකරණය පිළිගන්නේ නම් ඒ වියදම් නියෝජ්‍යායතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**33.** නියෝජ්‍යායතනය විසින් පහත සඳහන් කාර්ය සඳහා රීති සාදනු ලැබිය හැකිය:— රීති.

(අ) පරීක්ෂණ ක්‍රම පිළිගැනීම, ලියාපදිංචි පරීක්ෂණ සංචිත පිහිටුවීම, සාම්පල එකතු කිරීම, පරීක්ෂණ රසායනාගාර ප්‍රතීතනය කිරීම, පරීක්ෂණ රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිති සංග්‍රහය පදනම් කරගෙන පරීක්ෂණ රසායනාගාර විසින් පවත්වාගෙන යා යුතු ප්‍රමිතීන් සඳහා වන ක්‍රියා පටිපාටිය පැහැදිලි කිරීම;

(ආ) සාම්පල විශ්ලේෂණය කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය;

(ඇ) සාම්පල සම්බන්ධයෙන් වන ප්‍රතිඵල පාලනය කිරීම සඳහා වන ක්‍රියා පටිපාටිය;

(ඈ) නිශ්චිතව සඳහන් කරන අදාළ උත්තේජක මර්දන රීති සහ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵල;

(ඉ) නිශ්චිතව සඳහන් කරන උත්තේජක මර්දන පාලන කාර්යයන්;

(ඊ) ඍණාත්මක විශ්ලේෂණ තීරණ සහ අසතුටුදායක විශ්ලේෂණ තීරණ මෙන්ම ක්‍රීඩකයකුගේ තාවකාලික තහනම සහ ක්‍රීඩකයකුගේ තහනම් කිරීම් පාලනය කරන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අදාළ වන නිශ්චිතව සඳහන් කරන ක්‍රියා පටිපාටි;

(උ) චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ) ප්‍රදානය කිරීමේ දී සම්බන්ධ වන නිශ්චිතව සඳහන් කරන කාරණා;

(ඌ) සාම්පල් පරීක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සංග්‍රහය මත පදනම් වූ සාම්පල් පරීක්ෂා කිරීම සඳහා වන නිශ්චිතව සඳහන් කරන ශ්‍රී ලංකා ප්‍රමිති සංග්‍රහය;

(එ) තරඟ තහනමට ලක්වූ ක්‍රීඩකයකු තරඟවලට නැවත පැමිණීම සඳහා වූ ක්‍රියා පටිපාටිය;

(ඒ) ස්වාධීන නිරීක්ෂකයන්ට ප්‍රවේශය සැපයීම සඳහා වන ක්‍රියා පටිපාටිය;

(ඔ) ක්‍රීඩකයන් තරඟ තුළ දී පරීක්ෂා කර බැලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය; සහ

(ඕ) ක්‍රීඩකයන් තරඟවලින් බැහැරව පරීක්ෂා කර බැලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියෝජ්‍යායතනය විසින් සාදන ලද රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

**34.** (1) මේ පනතින් නියම කරනු ලැබිය යුතු යයි නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ නියෝග සෑදිය යුතු යැයි නියම කරන ලද හෝ බලය දෙන ලද කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට ක්‍රියාත්මක භාවයට එළඹිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් නමුත් එම නියෝගය සිදු කිරීමෙන් දින හැටක කාලසීමාවක් ඉක්මවීමට පෙරාතුව අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලබන ඕනෑම නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එය අනුමත නොකරන ලද දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වලංගු භාවය.

**35.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ නියමන්ට අනුකූලව සහ නියෝජ්‍යායතනය විසින් සම්පාදනය කරන ලද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නීති සංග්‍රහයේ නියමයන්ට අනුකූලව සහ 2009 අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලද සහ මේ පනත ක්‍රියාත්මකභාවයට එළඹෙන දිනට පෙරාතුවම වූ දිනයේ බලාත්මකව පැවති ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සිදු කරන ලද සියලු ක්‍රියාවන්, දේ හෝ කාරණාවන් එය විසින් ගන්නා ලද සහ ක්‍රියාත්මක කරන ලද තීරණයන් මේ පනතේ 10 වන වගන්තිය මගින් පත් කරන ලද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් ගන්නා ලද, සිදු කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාවන්, දේ සහ තීරණ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒවා වලංගු වී ඇති බවට සහ වලංගු විය යුතු බවට සලකනු ලැබිය යුතු අතර ඒවා සම්බන්ධයෙන් වන සියලු සිවිල් හෝ අපරාධ නඩු ක්‍රියාමාර්ගයන්ට එරෙහිව අදාළ සියලු තැනැත්තන් මෙයින් වගකීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

අර්ථනිරූපනය.

**36.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"ක්‍රීඩකයා" යන්නෙන්, ජාත්‍යන්තර හෝ ජාතික මට්ටමේ ක්‍රීඩාවකට හෝ කිසියම් ක්‍රීඩාවකට සහභාගී වන ඕනෑම තැනැත්තකු අදහස් වේ;

"සීඒඑස්" (CAS) යන්නෙන්, ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය අදහස් වේ;

"නීති සංග්‍රහය" යන්නෙන්, 2003 මාර්තු මස 5 වන දින කොපන්හේගන්හි දී රැස් වූ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) විසින් පිළිගත්, කලින් කලට සංශෝධිත, ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය අදහස් වේ;

"තරඟය" යන්නෙන්, කේවල තරඟයක්, සමූහ තරඟයක්, ක්‍රීඩාවක් හෝ සුවිශේෂී ක්‍රීඩා තරඟයක් අදහස් වේ;

"තරඟ තුළ දී පරීක්ෂා කර බැලීම" යන්නෙන්, ජාත්‍යන්තර සම්මේලනයේ හෝ අනෙකුත් අදාළ උත්තේජක මර්දන සංවිධානයේ රීතිවල අන්‍යාකාරයෙන් දක්වා නොමැත්තේ නම් විශේෂිත තරඟයක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සඳහා ක්‍රීඩකයකු තෝරාගෙන ඇති අවස්ථාවක එම පරීක්ෂණය තරඟය තුළ දී සිදු කරන ලද්දක් ද තරඟයට බැහැර දී සිදු කරන ලද්දක් ද යන්න වෙනස් කොට හඳුනා ගැනීම අදහස් වේ;

"ක්‍රීඩකයකු පුහුණු කිරීමේ දී සම්බන්ධවන තැනැත්තා" යන්නෙන්, භාරකාරයා, තරඟ තීරක, ක්‍රීඩා විනිසුරු (අම්පයර්) තීරකවරයා, ක්‍රීඩා කළමනාකරු, ක්‍රීඩා පුහුණුකරු, අභ්‍යාසකයකු, ක්‍රීඩා සහායක, සම්භාහකයා, භෞතචිකිත්සක, වෛද්‍ය නිලධරයකු, හෝ පරිපූරක වෛද්‍ය නිලධරයකු වන යම් තැනැත්තකු ඇතුළත් වේ;

"ක්‍රීඩා සංවිධානය" යන්නෙන්, ක්‍රීඩා එකක් හෝ කීපයක් සඳහා වන ඉසව්වක් සඳහා පාලක මණ්ඩලයක් ලෙස කටයුතු කරන ඕනෑම සංවිධානයක් අදහස් වේ;

"පරීක්ෂා කිරීම" යන්නෙන්, පරීක්ෂණ ව්‍යාප්ති සටහන සම්බන්ධ වන උත්තේජක පාලන ක්‍රියාවලියේ කොටස්, සාම්පල, රැස්කිරීම, සාම්පල හැසිරවීම සහ සාම්පල රසායනාගාරවලට ප්‍රවාහනය කිරීම අදහස් වේ;

"චිකිත්සක භාවිත මුක්තිය (ටීයූඊ)" යන්නෙන්, චිකිත්සක භාවිත මුක්තිය ප්‍රදානය කිරීම සඳහා වූ ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රදානය කරන ලද මුක්තියක් අදහස් වේ;

"භාවිත" යන්නෙන්, තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් යම් ඕනෑම ආකාරයකින් ආලේප, නික්ෂේපණය හෝ පාවිච්චි කිරීම් අදහස් වේ;

"ලෝක - උත්තේජක මර්දන නියෝජ්‍යායතනය" (WADA) යන්නෙන්, 1999 නොවැම්බර් මස 10 වන දින ස්විට්සර්ලන්තයේ දී ක්‍රීඩාවල උත්තේජක භාවිතයට එරෙහිව ඇති කරගන්නා ලද ජාත්‍යන්තර සම්මුතියේ කාර්යය සඳහා පිහිටුවන ලද ඒකකය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**37.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.